# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1997 අංක 20 දරන
# සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත

---

**[සහතිකය සටහන් කළේ 1997 අගෝස්තු මස 12 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1997 අගෝස්තු මස 15 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 11.25 යි.** **තැපැල් ගාස්තුව : රු. 4.60 යි.**

## 1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත

[සහතිකය සටහන් කළේ 1997 අගෝස්තු මස 12 වන දින]
එල්.ඩී.-ඕ. 8/96.

**ලොතරැයි පැවැත්වීම සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලයක් පිහිටුවීම පිණිස ද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස ද, වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත 1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

### I වන කොටස

### සංවර්ධන ලොතරැයි මණ්ඩලය පිහිටුවීම

2. (1) සංවර්ධන ලොතරැයි මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලබන, (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරන) මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය. සංවර්ධන ලොතරැයි මණ්ඩලය පිහිටුවීම.

(2) මණ්ඩලය, (1) වන උපවගන්තියෙහි ඊට දී ඇති නාමයෙන්, අඛණ්ඩ පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, මණ්ඩලය විසින්, එහි සංස්ථා නාමයෙන් නඩු පැවරීම ද, මණ්ඩලයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය.

3. මණ්ඩලය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :- මණ්ඩලයේ සංයුතිය.

(අ) මෙහි පහත සඳහන් නිල බලයෙන් සාමාජිකත්වය ලබන සාමාජිකයන්ගෙන්, එනම් :-

(i) මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ සභාපතිවරයා හෝ ඔහුගේ නියෝජිතයා ;

(ii) ජනාධිපති ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයා ;

(iii) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයා ; සහ

(ආ) අමාත්‍යවරයා විසින් පත් කරන ලද තවත් සාමාජිකයන් දෙදෙනකු.

(ආ) ඡේදය යටතේ පත් කරන ලද සාමාජිකයකු මෙහි මින් මතු "පත් කළ සාමාජිකයා" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(2) යම් තැනැත්තෙක් –

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් :

(ආ) තමා විසින් ම හෝ තමා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු මගින්, කෙළින් ම හෝ අන්‍යාකාරයකින් මණ්ඩලය විසින් හෝ මණ්ඩලය වෙනුවෙන් ඇති කර ගන්නා ලද යම් ගිවිසුමක් යටතේ යම් අයිතිවාසිකමක් හෝ ප්‍රතිලාභයක් දරන්නේ නම් හෝ භුක්ති විඳින්නේ නම් :

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල තැනැත්තකු බවට තීරණය කරනු ලැබ සිටී නම් හෝ ප්‍රකාශයට පත් කරනු ලැබ සිටී නම් :

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක, යම් නීතියක් යටතේ වස්තු භංගත්වයට පත් හෝ බංකොලොත් තැනැත්තකු ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබ නිදහස් කරනු නොලැබූ වස්තු භංගත්වයට පත් හෝ බංකොලොත් තැනැත්තකු වේ නම් :

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් මගින් (අත්හිට වූ සිරදඬුවමක් ද ඇතුළුව) බන්ධනාගාර ගත කිරීමේ දඬුවමක් නියම කර ඇති තැනැත්තකු නම්

ඒ තැනැත්තා, මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ එසේ කටයුතු කරගෙන යාමට හෝ නුසුදුස්සෙක් වන්නේ ය.

සාමාජිකයන්ගේ ධුර කාලය.

4. (1) මණ්ඩලයේ සෑම පත් කළ සාමාජිකයකු ම, මියයාම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා කලින් ධුරය හිස් කළහොත් මිස, ඔහු පත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු අතර, ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

(2) මණ්ඩලයේ නිලබලයෙන් පත් වූ සෑම සාමාජිකයකු ම, ඔහු මණ්ඩලයේ සාමාජිකයකු වූයේ යම් තනතුරක් දැරීම ප්‍රකාරව ද, ඒ තනතුර දරන තාක් කල් ධුරය දැරිය යුතු ය.

(3) රෝගාතුරවීම, අබලතාවට පත්වීම හෝ මාස තුනකට නොඅඩු කාලයක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට, මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකුට තාවකාලිකව නොහැකිවන අවස්ථාවක, එසේ නොහැකිවීම පිළිබඳව අමාත්‍යවරයාට ලියවිල්ලකින් දැන්වීම ඒ සාමාජිකයාගේ යුතුකම විය යුතු අතර, එසේ දන්වනු ලැබූ විට අමාත්‍යවරයා විසින් 3 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් ඔහු වෙනුවෙන් වැඩ බැලීම සඳහා වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

5. (1) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින්, යම් පත් කළ සාමාජිකයකු කිසිම හේතුවක් නොදක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

පත් කළ සාමාජිකයන් ඉවත් කිරීම සහ ඉල්ලා අස්වීම.

මේ වගන්තිය යටතේ නියමයක් කරනු ලැබුවේ යම් සාමාජිකයකු සම්බන්ධයෙන් ද, ඒ නියමය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට ඒ සාමාජිකයා විසින් ධුරය හිස් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) යම් පත් කළ සාමාජිකයකු විසින් ඔහු ඉල්ලා අස්වන බවට, අමාත්‍යවරයා අමතා ලියාපදිංචි තැපෑලෙන් යවන ලිපියක් මගින්, කවර හෝ අවස්ථාවක, ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(3) යම් පත් කළ සාමාජිකයකු, මියයාම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීම නිසා, ධුරය හිස් කරන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් 3 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් ඒ සාමාජිකයා වෙනුවට අනුප්‍රාප්තවීම සඳහා වෙනත් යම් සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය. එසේ පත් කරනු ලබන යම් තැනැත්තකු, තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

6. (1) අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ සාමාජිකයන් අතුරින් මණ්ඩලයේ සභාපතිවරයකු පත් කරනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ සභාපතිවරයා.

(2) සභාපතිවරයා මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු අතර, මණ්ඩලයේ මෙහෙයවීමට හා පාලනයට යටත්ව, ඔහු මණ්ඩලයේ කටයුතු පරිපාලනය හා කළමනාකරණය භාරව සිටිය යුතු ය.

(3) රෝගාතුරවීම, අබලතාවට පත්වීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා සභාපතිවරයාට ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වුවහොත්, අමාත්‍යවරයා විසින් ඔහු වෙනුවෙන් වැඩ බැලීම සඳහා මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය.

(4) අමාත්‍යවරයා විසින් තත් කාර්ය සඳහා කිසිම හේතුවක් නොදක්වා, සභාපතිවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි අතර, ඒ ඉවත් කිරීම, කිසිම අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(5) සභාපතිවරයා විසින්, ඔහු ඉල්ලා අස්වන බවට අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින්, සභාපති ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(6) (4) වන හා (5) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, සභාපතිවරයාගේ ධුර කාලය, ඔහු මණ්ඩලයේ සාමාජිකත්වය දරන කාලසීමාව විය යුතු ය.

මණ්ඩලයේ රැස්වීම.

7. (1) මණ්ඩලයේ රැස්වීම් සෑම මාසයකට එක් වරක් හෝ පැවැත්විය යුතු අතර, ඊට අමතරව, මේ පනත යටතේ එහි කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වන පරිදි, අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් ඊට වැඩි ගණනක් පවත්වනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලයේ සභාපතිවරයා පැමිණ සිටී නම්, ඔහු මණ්ඩලයේ සෑම රැස්වීමක ම මූලාසනය දැරිය යුතු ය. එවැනි යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විටක, පැමිණ සිටින සාමාජිකයන් විසින්, තමන් අතුරින් යම් සාමාජිකයකු ඒ රැස්වීමේ මූලාසනය දැරීම සඳහා තෝරා පත්කර ගනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලයේ කවර හෝ රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් තුන් දෙනකු විය යුතු ය.

(4) සභාපතිවරයාට හෝ මණ්ඩලයේ යම් රැස්වීමක දී මූලාසනය දරන යම් සමාජිකයකුට ඔහුගේ ඡන්දයට අතිරේකව තීරණ ඡන්දයක් ද තිබිය යුතු ය.

(5) මේ පනතේ අනෙකුත් විධිවිධානවලට යටත්ව, මණ්ඩලයේ රැස්වීම් පිළිබඳව හා ඒ රැස්වීම්වල කටයුතු කිරීම පිළිබඳව මණ්ඩලය විසින් එහි කාර්ය පටිපාටිය විධිමත් කර ගනු ලැබිය හැකි ය.

8. මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් පැවතීමේ හෝ මණ්ඩලයේ යම් සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක්, මණ්ඩලයේ කිසිම ක්‍රියාවක්, තීරණයක් හෝ කටයුත්තක් බලරහිත වන්නේ යයි සලකනු නොලැබිය යුතු ය. පුරප්පාඩුවක් හෝ සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුවෙන් මණ්ඩලයේ ක්‍රියාවක් හෝ කටයුතු අවලංගු නොවන බව.

9. මණ්ඩලයේ සාමාජිකයන්ට, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකට හා එසේ නිශ්චය කරනු ලබන යම් අනුප්‍රමාණ මත, මණ්ඩලයේ අරමුදලින් පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකි ය. මණ්ඩලයේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

10. (1) මණ්ඩලයේ මුද්‍රාව මණ්ඩලය විසින් නිශ්චය කර සකස් කළ හැකි අතර, එය මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් වෙනස් කරනු ලැබිය හැකි ය. මණ්ඩලයේ මුද්‍රාව.

(2) මණ්ඩලයේ මුද්‍රාව, මණ්ඩලය විසින් කලින් කල නිශ්චය කරනු ලබන යම් තැනැත්තකු භාරයේ තිබිය යුතු ය.

(3) මණ්ඩලයේ මුද්‍රාව මණ්ඩලයේ අනුමතය ඇතිව සහ සභාපතිවරයා හා මණ්ඩලයේ එක් සාමාජිකයකු ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට තබනු නොලැබිය යුතු අතර, ඒ සභාපතිවරයා හා සාමාජිකයා තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඒ සාධන පත්‍රයට හෝ ලේඛනයට තම අත්සන් තැබිය යුතු ය. ඒ අත්සන් කිරීම, සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් අත්සන් කරනු ලැබීමට පරිබාහිරව විය යුතු ය.

(4) මණ්ඩලයේ මුද්‍රාව තබන ලද සාධන පත්‍ර සහ ලේඛන පිළිබඳ රෙජිස්ටරයක් මණ්ඩලය විසින් පවත්වා ගෙන යනු ලැබිය යුතු ය.

11. (1) මණ්ඩලයේ කර්තව්‍ය පහත සඳහන් පරිදි විය යුතු ය :- මණ්ඩලයේ කර්තව්‍ය.

(අ) ජනාධිපති අරමුදලට අරමුදල් උත්පාදනය කිරීමේ කාර්යය සඳහා ලොතරැයි පැවැත්වීම හෝ පැවැත්වීම සඳහා කටයුතු පිළියෙල කිරීම ;

(ආ) එසේ පවත්වන ලද ලොතරැයිවලින් ලැබෙන මුදල්, ජනාධිපති අරමුදලින් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලට දායක මුදල් ලබාදිය හැකිවන පරිදි, මේ පනතින් විධිවිධාන සලසා ඇති ආකාරයට, ජනාධිපති අරමුදලට ප්‍රේෂණය කිරීම.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා, මණ්ඩලයට පහත සඳහන් බලතල තිබිය යුතු ය :–

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම හෝ මණ්ඩලයේ යම් චංචල හෝ නිශ්චල දේපළක් උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ආ) මණ්ඩලයේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා, අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන නියම හා කොන්දේසි මත ණය ලබා ගැනීම ;

(ඇ) මුදලින් හෝ වෙනත් ආකාරයකින් වූ ත්‍යාග, ප්‍රදාන හෝ පරිත්‍යාග භාර ගැනීම සහ ඒවා මණ්ඩලයේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා යෙදවීම ;

(ඈ) අමාත්‍යවරයා විමසා, මණ්ඩලයේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් හා සේවකයන් පත් කිරීම, ඔවුන් සේවා නියුක්තියේ යෙදවීමේ නියම හා කොන්දේසි නිශ්චය කිරීම ;

(ඉ) ඒ නිලධරයන්ට හා සේවකයන්ට ගෙවිය යුතු වේතන, වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික, අමාත්‍යවරයා විමසා නිශ්චය කිරීම ;

(ඊ) ඒ නිලධරයන්ගේ හා සේවකයන්ගේ ප්‍රතිලාභය පිණිස, අර්ථසාධක අරමුදල් සහ වෙනත් යෝජනා ක්‍රම, අමාත්‍යවරයා විමසා පිහිටුවීම, ඒවා විධිමත් කිරීම සහ ඒ අරමුදල්වලට හෝ යෝජනා ක්‍රමවලට දායක මුදල් ගෙවීම ;

(උ) මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම හා කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය වන සියලු ගිවිසුම්වලට ශ්‍රී ලංකාව තුළ දී හෝ ඉන් පිටත දී එළඹීම සහ ඒ ගිවිසුම් ඉටු කිරීම ;

(ඌ) මණ්ඩලයේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීම ; සහ

(එ) සාමාන්‍යයෙන් මණ්ඩලයේ කර්තව්‍ය නිසි ලෙස ඉටු කිරීම පහසු කිරීම සඳහා අවශ්‍ය වෙනත් සියලු දේ කිරීම.

**12.** මේ පනත යටතේ එහි බලතල ක්‍රියාත්මක කිරීමේ දී හා කර්තව්‍ය ඉටු කිරීමේ දී මණ්ඩලය වෙත අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලැබිය හැකි යම් සාමාන්‍ය හෝ විශේෂ විධානවලට මණ්ඩලය යටත් විය යුතු ය. අමාත්‍යවරයා විසින් මණ්ඩලයට විධාන දිය හැකි බව.

II වන කොටස

## මුදල් සහ මණ්ඩලයේ කාර්ය මණ්ඩලය

**13.** (1) මණ්ඩලයට, (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) මණ්ඩලයේ ම අරමුදලක් විය යුතු ය. මණ්ඩලයේ අරමුදල.

(2) ඒ අරමුදලට–

(අ) මණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණයන් : සහ

(ආ) අරමුදලට ගෙවිය යුතු යයි මේ පනතින් නියමිත සියලු මුදල්

බැර කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ, මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී හා කර්තව්‍ය ඉටු කිරීමේ දී මණ්ඩලය විසින් දරන ලද වියදම් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් සහ අරමුදලින් ගෙවිය යුතු යයි මේ පනතින් නියමිත සියලු මුදල්, අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) අරමුදලින් මුදල් ගෙවීම සඳහා වන සියලු චෙක්පත්, මණ්ඩලය විසින් සාදනු ලබන රීති මගින් නියම කරනු ලැබිය හැකි, මණ්ඩලයේ යම් සාමාජිකයකු සහ මණ්ඩලය විසින් සේවයෙහි නියුක්ත කරන ලද යම් නිලධරයකු විසින් අත්සන් කළ යුතු ය.

**14.** (1) මණ්ඩලයේ මුදල් වර්ෂය, ලිත් වර්ෂය විය යුතු ය. මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය.

(2) මණ්ඩලය විසින් ජනාධිපති අරමුදලට ගෙවන ලද දායක මුදල්, එහි වත්කම් හා බැරකම් සහ මණ්ඩලයේ වෙනත් සියලු ගනුදෙනු ඇතුළුව ආදායම හා වියදම පිළිබඳව නිසි ගිණුම් පොත් තබා ගැනීමට මණ්ඩලය විසින් සැලැස්විය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, මණ්ඩලයේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත් කිරීම.

15. (1) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු මණ්ඩලයේ ඉල්ලීම පිට, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ හෝ අදාළ අමාත්‍යාංශයේ හෝ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් එවැනි ම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාලසීමාවක් සඳහා මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය : නැතහොත් එවැනි ම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු, මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට, ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ, 13 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) නිශ්චිත කාලසීමාවක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වී ආණ්ඩුව සමග ගිවිසුමකට ඇතුළත් වී ඇති යම් තැනැත්තකු මණ්ඩලය විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා විසින් මණ්ඩලයට සේවය කරනු ලබන යම් කාලසීමාවක්, ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරනු ලබන සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

## III වන කොටස

## ලොතරැයි පැවැත්වීම

මණ්ඩලය විසින් ලොතරැයි පැවැත්විය යුතු බව.

16. (1) මණ්ඩලය විසින් මේ පනතේ කාර්යය සඳහා ලොතරැයි පැවැත්විම හෝ ලොතරැයි පැවැත්වීමට කටයුතු පිළියෙල කිරීම හෝ කරනු ලැබිය යුතු ය. එසේ පවත්වනු ලබන සෑම ලොතරැයියක් ම මෙහි මින් මතු සංවර්ධන ලොතරැයියක් යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(2) සෑම සංවර්ධන ලොතරැයියක් ම නියමිත යම් ආකාරයකට, එහෙත් මේ පනතේ විධිවිධානවලට යටත්ව, පවත්වනු ලැබිය යුතු ය.

17. (1) එක් එක් සංවර්ධන ලොතරැයියෙහි ප්‍රදානය කරනු ලබන ත්‍යාග සංඛ්‍යාව, සහ ඒ එක් එක් ත්‍යාගයේ වර්ගය හා වටිනාකම, නියමිත පරිදි විය යුතු ය. සංවර්ධන ලොතරැයි ත්‍යාග.

(2) සංවර්ධන ලොතරැයියක ප්‍රදානය කරනු ලබන සෑම ත්‍යාගයක් ම, මෙහි පහත සඳහන් දේවලින් සමන්විත විය හැකි ය :-

(අ) නිවසක් ;
(ආ) මෝටර් වාහනයක් ;
(ඇ) කවර හෝ විස්තරයකට අයත් යම් භාණ්ඩයක් ; හෝ
(ඈ) මුදල් ප්‍රමාණයක්.

(3) (2) වන උපවගන්තිය යටතේ ප්‍රදානය කරනු ලබන යම් ත්‍යාගයක්, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත යටතේ ආදායම් බදු ගෙවීමෙන් නිදහස් වන්නේ ය.

(4) සෑම සංවර්ධන ලොතරැයියක් ම ත්‍යාගලාභීන් ප්‍රසිද්ධියේ හෝ නියම කරනු ලැබිය හැකි වෙනත් යම් ආකාරයකින් හෝ නොම්මර ඇදීමෙන් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(5) යම් සංවර්ධන ලොතරැයියක ත්‍යාගලාභීන් නිශ්චය කරනු ලැබූ දින සිට ගණන් බලනු ලැබූ මාස හයක කාලසීමාවක් ඉකුත්වීමෙන් පසුව, ඒ ලොතරැයියේ ඒ ත්‍යාගයට හිමිකම් ලබන තැනැත්තා සොයා ගැනීමට නොහැකිවීමේ හේතුවෙන් ඒ ලොතරැයියේ ප්‍රදානය කරනු ලැබ නොමැති යම් ත්‍යාගයක්, රජය සන්තක විය යුතු අතර, ත්‍යාගය යම් මුදල් ප්‍රමාණයක් වන අවස්ථාවක, ඒ මුදල් ප්‍රමාණය හෝ ත්‍යාගය, නිවසක්, මෝටර් වාහනයක් හෝ වෙනත් භාණ්ඩයක් වන අවස්ථාවක නිවස, මෝටර් වාහනය හෝ භාණ්ඩය විකිණීමෙන් ලැබෙන මුදල පළමුකොට අරමුදලට ද ඉන් පසුව එය ජනාධිපති අරමුදලට ද බැර කරනු ලැබිය යුතු ය :

එසේ වුවද, ඒ ත්‍යාගය හා සම්බන්ධව කරන ලද යම් හිමිකම් පෑමකින් උද්ගත වූ යම් නඩුවක් හෝ නඩුකටයුත්තක්, ඉහත කී මාස හයක කාලසීමාව ඉකුත්වන විට දී යම් අධිකරණයක් ඉදිරියෙහි විනිශ්චයට භාජනව පවතීනම්, එසේ

රජය සන්තක කිරීමක් නොකළ යුතු අතර, ඒ තඩුව හෝ නඩු කටයුත්ත අවසාන වශයෙන් විනිශ්චයක් කිරීමේ දී යම් තැනැත්තකු ඒ ත්‍යාගයට හිමිකම් ලබන බවට ප්‍රකාශ කරනු ලැබුවහොත්, මණ්ඩලය විසින් ඒ තැනැත්තාට ඒ ත්‍යාගය ප්‍රදානය කරනු ලැබිය යුතු ය : තවද කිසිම තැනැත්තකු එසේ හිමිකම් ලබන්නේ යයි ප්‍රකාශ කරනු නොලැබුවහොත්, සහ ත්‍යාගය මුදල් ප්‍රමාණයක් වන අවස්ථාවක ඒ මුදල් ප්‍රමාණය හෝ ත්‍යාගය නිවසක්, මෝටර් වාහනයක් හෝ වෙනත් යම් භාණ්ඩයක් වන අවස්ථාවක, ඒ නිවස, මෝටර් වාහනය හෝ භාණ්ඩය විකිණීමෙන් ලැබෙන මුදල පළමුකොට අරමුදලට ද ඉන් පසුව එය ජනාධිපති අරමුදලට ද බැර කරනු ලැබිය යුතු ය.

සංවර්ධන ලොතරැයිවලින් ලැබෙන මුදල්.

**18.** (1) මේ පනත යටතේ පවත්වනු ලබන සෑම සංවර්ධන ලොතරැයියකින් ම ලැබෙන මුදල්, පළමුකොට අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(2) සෑම සංවර්ධන ලොතරැයියකින් ම ලැබෙන මුදල, එම මුදලින්,

(අ) මණ්ඩලය විසින් ඒ ලොතරැයිය පැවැත්වීම සඳහා දරන ලද, ඒ ලොතරැයියෙන් ප්‍රදානය කරන ලද ත්‍යාගවල වටිනාකම ද ඇතුළුව, වියදම් පියවීමේ අරමුදලට හෝ වියදම් ප්‍රතිපූරණය කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය මුදල :

(ආ) මණ්ඩලයේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවීමක් වේ නම් ඒ සම්පූර්ණ පාරිශ්‍රමික හෝ ඉන් කොටසක් සහ මණ්ඩලයේ නිලධරයන්ගේ හා සේවකයන්ගේ පාරිශ්‍රමික ගෙවීමේ කාර්යය සඳහා අවශ්‍ය මුදල :

(ඇ) 11 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඊ) ඡේදය යටතේ සඳහන් යම් අර්ථසාධක අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට මණ්ඩලය විසින් ගෙවිය යුතු යම් දායක මුදලක් සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් ගෙවීමේ කාර්යය සඳහා අවශ්‍ය මුදල : සහ

(ඇ) මණ්ඩලයේ වෙනත් බැරකම් දැරීමේ කාර්යය සඳහා අවශ්‍ය මුදල

වශයෙන්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අනුමත කරන ලද මුදල් ප්‍රමාණයක් අඩු කිරීමෙන් පසුව, ඉතිරිවන මුදල මණ්ඩලය විසින් ජනාධිපති අරමුදලට ගෙවිය යුතු ය.

(3) සංවර්ධන ලොතරැයියක යම් ත්‍යාග මුදලක් කිසිම තැනැත්තකු විසින් දිනා නොමැති අවස්ථාවක, මේ වගන්තියේ කුමක් සඳහන් ව ඇත ද ඒ ත්‍යාග මුදල 'ත්‍යාග සංචිත ගිණුමකට' බැර කරනු ලැබිය යුතු අතර, ඒ ගිණුමෙහි එකතුවන මුදල් ප්‍රමාණය, ඉන් පසුව පැවැත්වෙන සංවර්ධන ලොතරැයිවල ත්‍යාග ප්‍රදානය කිරීම සඳහා යොදා ගනු ලැබිය යුතු ය.

19. (1) නියමිත යයි මේ පනතින් ප්‍රකාශිත හෝ බලය දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන් හෝ රීති පැදීමට මේ පනතින් බලය දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන් මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය හැකි ය. රීති.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, මෙහි පහත දැක්වෙන කාරණා සියල්ල ම හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය :-

(අ) සෑම සංවර්ධන ලොතරැයියක ම ටිකට් පත් විකිණිය යුතු මිල ;

(ආ) සෑම සංවර්ධන ලොතරැයි ටිකට් පතක ම සඳහන් කළ යුතු විස්තර ;

(ඇ) ඒ සෑම සංවර්ධන ලොතරැයියක ම ටිකට් පත් විකිණිය යුතු හෝ විකිණීම සඳහා ඉදිරිපත් කළ යුතු ආකාරය ;

(ඈ) සංවර්ධන ලොතරැයි ටිකට් පත් විකිණීම සඳහා අනුයෝජිතයන් සේවයේ නියුක්ත කිරීම හා ඒ අනුයෝජිතයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමිකය ;

(ඉ) ඒ සෑම සංවර්ධන ලොතරැයියක ම ත්‍යාග දිනූ එක් එක් ටිකට්පතේ අංකය සහ ඒ ටිකට් පතට හිමිකම ඇති තැනැත්තාගේ නම හා ලිපිනය ප්‍රසිද්ධ කිරීම ; සහ

(ඊ) මේ පනත යටතේ රීති සෑදිය යුතු යයි නියමිතව ඇත්තේ වෙනත් යම් කාරණා සම්බන්ධයෙන් ද ඒ සියලු කාරණා.

(3) මේ වගන්තිය යටතේ මණ්ඩලය විසින් සාදන ලද කිසිම රීතියක්, අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ, හැකි පහසු ඉක්මණින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන තෙක්, බලාත්මක නොවිය යුතු ය.

## IV වන කොටස

## පොදු විධිවිධාන

මණ්ඩලය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් විය යුතු බව.

**20.** මණ්ඩලය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

**21.** මණ්ඩලයේ සියලු නිලධරයන් සහ සේවකයන්, දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා, රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

ලොතරැයි ආඥාපනත ලොතරැයිවලට අදාළ නොවිය යුතු බව.

**22.** (1) (45 වන අධිකාරය වූ) ලොතරැයි ආඥාපනතේ විධිවිධාන සහ 1963 අංක 11 දරන මුදල් පනතේ I වන කොටසේ විධිවිධාන, මේ පනත යටතේ පවත්වනු ලබන හෝ පැවැත්වීමට කටයුතු පිළියෙල කරනු ලබන ලොතරැයියකට සහ ඒ ලොතරැයියක් සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

(2) (අ) සංවර්ධන ලොතරැයියක් පැවැත්වීම හෝ පැවැත්වීමට කටයුතු පිළියෙල කිරීම ;

(ආ) සංවර්ධන ලොතරැයියක ටිකට් පතක් ඇඳීම ;

(ඇ) සංවර්ධන ලොතරැයියක ටිකට් පතක් මිල දී ගැනීම හෝ විකිණීම ;

(ඈ) සංවර්ධන ලොතරැයියක් පැවැත්වීමෙහි ලා සහාය වීම ; හෝ

(ඉ) සංවර්ධන ලොතරැයියක් පැවැත්වීම සඳහා යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීම

(45 වන අධිකාරය වූ) ලොතරැයි ආඥාපනතේ විධිවිධාන උල්ලංඝනය කිරීමක් නොවන බවත්, සංවර්ධන ලොතරැයියක් සම්බන්ධයෙන් එකී ආඥාපනතේ 19 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීමට, මණ්ඩලය යටත් නොවන බවත්, සැක දුරු කිරීම පිණිස මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත හෝ කරන ලද ක්‍රියා සඳහා ආරක්ෂාව.

**23.** (1) (අ) මණ්ඩලය විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් මණ්ඩලයට විරුද්ධව ; හෝ

(ආ) මණ්ඩලයේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයකු විසින් මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට, නිලධරයාට හෝ සේවකයාට විරුද්ධව

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) යම් අධිකරණයක් ඉදිරියෙහි මණ්ඩලය විසින් හෝ මණ්ඩලයට විරුද්ධව හෝ ගෙනෙනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී මණ්ඩලය විසින් දරන ලද යම් වියදමක්, මණ්ඩලයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී මණ්ඩලයට ගෙවන ලද හෝ මණ්ඩලය විසින් අය කර ගන්නා ලද ගාස්තු කිසිවක් අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින්, මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන්, අධිකරණයක් ඉදිරියෙහි ඔහුට විරුද්ධව ඉදිරිපත් කරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඔහු විසින් දරන ලද වියදම් කිසිවක්, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලදැයි අධිකරණය තීරණය කරන්නේ නම්, එකී වියදම් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඔහු විසින් අයකර ගනු ලැබී නම් මිස, මණ්ඩලයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

වැරදි.

**24.** (අ) යම් සංවර්ධන ලොතරැයියක කාර්ය සඳහා වන යම් ටිකට් පතක්, ඒ ටිකට් පත සඳහා, මේ පනත යටතේ සාදන ලද රීති මගින් නිශ්චිතව නියම කරන ලද මිල ඉක්මවන මිලකට විකුණන හෝ විකිණීම සඳහා ඉදිරිපත් කරන ; හෝ

(ආ) එවැනි යම් ලොතරැයියක කාර්ය සඳහා වූ යම් ටිකට් පතක් කූට ලෙස සකස් කරන හෝ වෙනස් කරන ; හෝ

(ඇ) කූට ලෙස සකස් කරන ලද හෝ වෙනස් කරන ලද ටිකට් පතක් බව දැන දැනම, සංවර්ධන ලොතරැයියක කාර්ය සඳහා යම් ටිකට් පතක් විකුණන හෝ විකිණීම සඳහා ඉදිරිපත් කරන

සෑම තැනැත්තකු ම, මේ පනත යටතේ වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට දෙආකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

අන්තර් කාලීන විධිවිධාන.

**25.** (1) (මෙහි මින් මතු "භාරය" යනුවෙන් සඳහන් කරනු ලබන), 1993 මැයි මස 25 වන දින පිහිටුවන ලද සංවර්ධන ලොතරැයි භාරය යටතේ භාරකරු විසින් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවීමේ දිනයට ඉහතින් ම වූ දිනයේ දී, දරනු ලැබූ සියලු භාර දේපළ මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට, ඒ දේපළ හා සම්බන්ධ කවර හෝ භාරයකින් නිදහස්ව, මණ්ඩලය වෙත සතු වූ දේපළ ලෙස හා මණ්ඩලයේ දේපළ ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) 1993 මැයි මස 25 වන දින පිහිටුවන ලද භාරයේ භාරකරු විසින් ඇතුළත් වන ලද සහ මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට ඉහතින් ම වූ දිනයේ දී පැවති සියලු ගිවිසුම් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට බලාත්මක වන පරිදි මණ්ඩලයේ ගිවිසුම් ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) භාරයේ භාරකරු විසින් දරන ලදුව, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට ඉහතින් ම වූ දිනයේ දී පැවති බැරකම්, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට බලාත්මක වන පරිදි මණ්ඩලයේ බැරකම් ලෙස සලකනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**26.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

**27.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි- අර්ථ නිරූපණය.

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, සහ ඉටු කිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇති කොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරියක් ඊට ඇතුළත් වේ :

"මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල" යන්නෙන්, 1981 අංක 66 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පනතින් පිහිටුවන ලද මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල අදහස් වේ :

"නියමිත" යන්නෙන්, මේ පනත යටතේ සාදන ලද රීති මගින් නියමිත බව අදහස් වේ :

"ජනාධිපති අරමුදල" යන්නෙන්, 1978 අංක 7 දරන ජනාධිපති අරමුදල පනතින් පිහිටුවන ලද ජනාධිපති අරමුදල අදහස් වේ :

"පළාත් සභාව" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154අ ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද පළාත් සභාවක් අදහස් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.